**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை**
**AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD**

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Bakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda


මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } AAIB/8/G/0077

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ..............................

දිනය / திகதி / Date } 2025.06.02

## <u>මාධ්‍ය නිවේදනය.</u>

## <u>පසුගිය වර්ෂාව හා අධික සුලං තත්වය යටතේ වගාවන්ට සිදුවූ හානි හඳුනා ගැනීම.</u>

පසුගිය දින කිහිපය මුළුල්ලේ ඇදහැළුනු වර්ෂාව සහ අධික සුළං තත්ත්වය හේතුවෙන් සිදුවූ වගා හානි පිළිබඳව තක්සේරු කිරීම් කටයුතු කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් මේ වන විටත් ආරම්භ කර ඇත.

මෙහිදී වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු, සෝයා බෝංචි සහ අමු මිරිස් යන වගාවන් වලට සිදුවන හානි සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම අවශ්‍ය නොවන අතර අක්කර 05 ක් දක්වා නොමිලේ රක්ෂණ වන්දි ගෙවීම සිදු කෙරේ. ඒ අනුව වගා හානියකදී හෙක්ටයාරයක් සඳහා රු.100,000/- ක උපරිමයක් දක්වා රක්ෂණ මුදල් නිදහස් කරනු ලැබේ.

ඉහත තත්වය යටතේ දැනට මාතර දිස්ත්‍රික්කයේ ගොවියන් 100 ක ගේ පමණ කුඹුරු අක්කර 130ක් හානියට පත්ව ඇති බව වාර්තා වී ඇති අතර ඉදිරි දින කිහිපය තුළදී වගා හානිවීම් පිළිබඳව නිරන්තර අධීක්ෂණය ලක් කිරීමට බලාපොරොත්තු වේ.

අපදාවට පත් වූ කුඹුරු ඇතුළු අනෙකුත් වගාවන් හි ජලය මේ වන විට ක්‍රමයෙන් බැස යාමට ලක් වන බව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් භාර අධ්‍යක්ෂවරුන් අප වෙත දන්වා ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්ෂණික දුරකථන අංකය වන 1918 අමතා ගොවීන්ට තම වගා හානි වීම් අපවෙත දැනුවත් කිරීම සිදු කල හැකිය.

පේමසිරි ජාසිංආරච්චි,
සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.


දුරකථන / தொலைபேசி / Telephones
ෆැක්ස් / பெக்ஸ் / Fax

සභාපති / தலைவர் / Chairman
011-3484860
011-2812573
e-mail: chairman@aib.gov.lk

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General
011-3484863
011-2812574
e-mail: dg@aib.gov.lk

ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office
011-2384000